**පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය - 2017**

--------------------------------------------------------------------------

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 1979 අංක 08 දරන පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 23 වගන්තිය, විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වැනි වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

---

**2.1 තත්ත්වාගණනය කළ මතය**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විදේශ ශිෂ්‍යත්ව අරමුදල් ආයෝජනය කිරීමෙන් සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු රු.83,654 ක පොළී ආදායම ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ආ) බැංකු ශේෂ සනාථ කිරීම් අනුව ස්ථාවර තැන්පතු 06 ක වටිනාකම රු.19,147,006 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව එම ආයෝජන වටිනාකම රු.18,915,063 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු වටිනාකම රු.231,943 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 1997 වර්ෂයේ සිට 2006 වර්ෂය දක්වා කාලය තුළ ප්‍රදාන ලෙස ආයතනයට ලැබී තිබුණු පිරිවැය රු.1,116,040 ක් වූ වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණද ඊට අදාළ අරමුදල ක්‍රමානුකූල පදනමක් මත ලියා හැරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) පිරිවැය හඳුනා නොගත් වත්කම් 159 ක වටිනාකම රු.581,800 ක් ලෙස 2016 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කර තිබුණද එම වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී වෙන්දේසි කර තිබූ වත්කම් වලට අදාල පිරිවැය හා සමුච්චිත ක්ෂය ගිණුම්වලින් ඉවත් කිරීමකින් තොරව විකුණුම් මිල රු.15,400 ක් අවිනිශ්චිත ගිණුමට බැර කර තිබුණි.

**2.2.2 අවිනිශ්චිත ගිණුම**

---

2011 වර්ෂයේ සිට පැවත එන අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය රු.5,120 ක් වුවද මෙම ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

ස්ථාවර වත්කම් ලේඛනය අනුව වත්කම් පන්තීන් 03 ක වටිනාකම රු.43,953,197 ක් වුවත් මූල්‍ය ප්‍රකාශන අනුව එම වටිනාකම රු.47,774,866 ක් වූයෙන් රු.3,821,669 ක පැහැදිලි නොකළ වෙනසක් නිරීක්ෂණය විය.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.**

පහත සඳහන් නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1979 දෙසැම්බර් 24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත 1979 අංක 08 දරන පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 11 (5) වගන්තිය | නිවාඩු ලබානොගෙන අනුගාමී රැස්වීම් 03 කට නොපැමිණියහොත් ධූරය අතහැර ගියා සේ සැලකිය යුතු වුවත් පීඨ සභාවට පත්වී තිබුණු කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි අධ්‍යයන අංශ ප්‍රධානියා සමාලෝචිත වර්ෂයේ කිසිම රැස්වීමක් සඳහා සහභාගී වී නොතිබුණු අතර සංස්කෘත අධ්‍යයන අංශය නියෝජනය කරමින් සහභාගීවී තිබූ පීඨ සභා සාමාජිකයා සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව නියෝජනය කරමින් සහභාගීවී තිබූ පීඨ සභා සාමාජිකයා අඛණ්ඩව රැස්වීම් වාර 04 කට සහභාගී වී නොතිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් අතිරික්තය රු.2,417,412 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.1,985,332 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,402,744 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ වියදම් රු.12,343,876 කින් වැඩිවී තිබුණද රජයේ පුනරාවර්තන ප්‍රදාන රු.10,192,000 කින් හා වෙනත් ආදායම් රු.6,554,621 කින් වැඩි වීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රතිඵලයේ ඌනතාවයක් ඇති වී තිබුණද 2017 වර්ෂයේදී අතිරික්තයක් ඇතිවී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික නැවත ගැලපීම් කිරීමෙන් පසු 2013 වර්ෂයේ රු.19,584,159 ක් වූ දායකත්වය 2017 වර්ෂය වනවිට රු.51,327,517 ක් දක්වා වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 සැලසුම් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා ආයතනය විසින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ 4 ඡේදය ප්‍රකාරව ඇතුළත් කළ යුතු ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර, අයවැය ලේඛනය, ක්‍රියාකාරකම් සැලැස්ම හා අක්මුදල් සැලැස්ම එම සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විදේශීය භික්ෂු ශිෂ්‍යයන් වැඩි පිරිසක් ලියාපදිංචිවන ඩිප්ලෝමා පාඨමාලා සඳහා පසුගිය වර්ෂයේ ලියාපදිංචිවූ ශිෂ්‍ය සංඛ්‍යාව 296 ක් වුවත් සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 93ක් වූ අතර සියයට 68 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

(ආ) අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩලයේ නිලධාරීන් 10 දෙනෙකුට පර්යේෂණ දීමනා ලෙස රු.2,226,043 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණද ඔවුන් පර්යේෂණ කටයුතුවල යෙදුන බවට හා ඒවායේ ප්‍රගතිය පර්යේෂණ කමිටුව විසින් පරීක්ෂා කළ බවට සාක්ෂි නිරීක්ෂණය නොවූ අතර අවසන් කළ පර්යේෂණවල අවසාන වාර්තා ද ඉදිරිපත් කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උපලේඛන අනුව, පර්යේෂණ හා ප්‍රකාශන පොත් ශේෂය 3947 ක් වුවද භෞතික තොග සමීක්ෂණ වාර්තා අනුව ශේෂය 3,605 ක් වූයෙන් රු.123,188 ක් වටිනා ප්‍රකාශන 342 ක ඌනතාවයක් පැවතියද එම ඌනතාවය හඳුනාගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුකර නොතිබුණි.

## 4.3 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය සතු බැංකු ගිණුමක 2017 දෙසැම්බර් 31 දිනට රු.7,559,436 ක ශේෂයක් පැවතුන අතර මෙම ගිණුමෙහි වර්ෂය පුරාම රු.5,367,521 ක සාමාන්‍ය ශේෂයක් පැවතීමෙන් ආයතනයේ අරමුදල් ඌන උපයෝජිතව පවතින බව නිරීක්ෂණය විය.

(ආ) අවශ්‍යතාවය හඳුනා ගැනීමෙන් තොරව අලෙවිය සඳහා පොත් සහ ප්‍රකාශන මුද්‍රණය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 10 ක් පමණ පැරණි සෙමින් නිකුත්වන පොත් 3258 ක ශේෂයක් පැවතුණි. මින් වර්ෂය තුළදී අලෙවි කළ හා පරිත්‍යාග කළ පොත් සංඛ්‍යාව 347 ක් පමණක් විය.

**5.** **තිරසාර සංවර්ධනය**

-------------------------

**5.1** **තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීම**

**----------------------------------------------------------------------------**

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළව පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

**6.** **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

---------------------------------------------

**6.1** **අයවැය පාලනය**

----------------------

2017 වර්ෂයේ පිළියෙල කර තිබූ අයවැය ලේඛනය අනුව තත්‍ය අගයන් සහ අයවැයගත අගයන් අතර සියයට 58 සිට සියයට 100 දක්වා වූ විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**7.** **පද්ධති හා පාලනයන්**

**-----------------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන නොකිරීම හා වසර 25 ක් පැරණි අබලන් වාහනය කඩිනමින් අපහරණය කිරීමට කටයුතු නොකිරීම. |
| (ආ) | ගබඩා පාලනය | තොග ඌනතා හා අතිරික්තතා ගලපා ගිණුම් නිවැරදි නොකිරීම. |
| (ඇ) | අයවැය පාලනය | අවශ්‍යතාවය ඉක්මවා වියදම් ඇස්තමේන්තු කිරීම. |